නිරවද්‍ය, පාඨකයා නොමඟ නොයවන තොරතුරු ඉදිරිපත් කිරීම, මාධ්‍ය වගකීමකි.
පාඨකයා හට නොමඟ නොයවන සහ නිවැරදි ම තොරතුරු ලබා දීම මාධ්‍ය සතු බැරෑරුම් වගකීමක් ලෙස සැලකිය හැක.
"පිටසක්වල මව් යානාවක් සෞරග්‍රහ මණ්ඩලය නිරීක්ෂණය කරනවා, විශේෂඥයන් 2 ක් මුල්වරට හෙළි කරති" යන සිරස්තලයෙන් යුතුව, මාර්තු 28, 2023 දින දිවයින මුල් පිටුවේ පළ කොට තිබූ පුවත් වාර්තාවක් පහත දැක්වේ. ඒ සම්බන්ධ නිරීක්ෂණ කිහිපයක් මෙසේ දැක්විය හැක:
මූලාශ්‍ර: මෙම පුවතට පාදක වූ මූලාශ්‍රයක් හෝ එය පළවූ ජාත්‍යන්තර මාධ්‍ය වාර්තාවක් සම්බන්ධයෙන් සඳහන් කර නොමැත. කෙසේ නමුත්, මීට සමාන පුවතක්, පර්යේෂණ පත්‍රිකා කෙටුම්පතක් පාදක කරගනිමින්, සමකාලීනව ජාත්‍යන්තර මාධ්‍ය තුළ පළ වී තිබේ. එම පත්‍රිකාව "Physical constrains on unidentified aerial phenomena" යන නමින් යුතුව ඉදිරිපත්වී ඇත.
එම පර්යේෂණ පත්‍රිකා කෙටුම්පත පදනම් කොට ගත් ජාත්‍යන්තර මාධ්‍ය වාර්තා නිරීක්ෂණය කිරීමේදී පහත කරුණු දැකගත හැක.
* මෙය නිසැකවම ස්ථිර වූ පුවතක් ලෙසින් නොදක්වන අතර ඒ වෙනුවට එය සිදුවීමට හැකි පුවතක් ලෙස දක්වයි.
* මෙම පුවතට පාදක වන අදාළ පර්යේෂණ පත්‍රිකා කෙටුම්පත හෝ වෙනත් මූලාශ්‍ර සඳහන් කරයි.
* මෙම පර්යේෂණ පත්‍රිකාව තවමත් කෙටුම්පතක් බවත්, එය පෙන්ටගනයේ නිල ලියැවිල්ලක් නොවන බවත් දක්වයි.
* මෙම පර්යේෂණ පත්‍රිකාව, ක්ෂේත්‍රයේ අනෙකුත් දැනුමැත්තන් විසින් සමාලෝචනය කර බලා (peer-reviewed) නොමැති බව සඳහන් කරයි.
ඒ අනුව,
1) මෙම පුවත වාර්තා කරනා ජාත්‍යන්තර මාධ්‍ය මගින්, මෙය පර්යේෂණ පත්‍රිකා කෙටුම්පතකින් ලබාගත් තොරතුරක් ලෙසින් මූලාශ්‍ර සහිතව දක්වන විට, දිවයින පුවත්පත මෙය නිසැකවම අනාවරණය කර ගත් පුවතක් ලෙසින් දක්වන්නේ යැයි ඔබ නොසිතන්නේ ද? එය පාඨකයා නොමඟ යවන සුළු නොවේ ද?
2) මෙවැනි වාර්තාවක් පාදක කොට ගත් පුවත් වාර්තාවක් ඉදිරිපත් කිරීමේදී, ඒ සම්බන්ධයෙන් මූලික පසුබිම් දැනුමක් හෝ ඇතිකරගනිමින්, නිරවද්‍ය සහ පාඨකයා දැනුවත් කරනා ආකාරයේ පුවතක් ඉදිරිපත් කිරීම මාධ්‍ය වගකීමක් නොවන්නේ ද?
මූලාශ්‍ර:
https://lweb.cfa.harvard.edu/~loeb/LK1.pdf
https://www.space.com/alien-mothership-lurking-in-solar...
https://www.reutersagency.com/en/about/standards-values/...
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

# පිටසක්වල යානාවක් සෞරග්‍රහ මණ්ඩලය නිරීක්ෂණයේ?

# තහවුරු වූ පුවතක් ද?

Alien mothership lurking in our solar system could be watching us with tiny probes, Pentagon official suggests



Avi Loeb, an astronomer at Harvard University, and Sean M. Kirkpatrick, director of the Pentagon's All-domain Anomaly Resolution Office (AARO) — established in July 2022 by the Department of Defense (DoD) to detect and study "objects of interest" — released the draft, Physical Constraints on Unidentified Aerial Phenomena, on March 7. It is not an official Pentagon document but was carried out in partnership with the DoD. It has not been peer-reviewed.

SPACE.com

2023-03-25




පිටසක්වල මව් යානාවක් සෞරග්‍රහ මණ්ඩලය නිරීක්ෂණය කරන බව හාවඩ් විද්‍යාඥයකු හා පෙන්ටගනයේ නිලධාරියකු හෙළිකර ඇත.

හාවඩ් විශ්වවිද්‍යාලයේ තාරකා විද්‍යාඥයකුවූ අයි. ලොයිඩ් සහ පෙන්ටගනයේ අධ්‍යක්ෂවරයකුවූ සීන් කර්ක් පැට්රික් මෙ බව මුල්වරට අනාවරණය කර තිබේ.

දිවයින

2023-03-28

ETHICS EYE